සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

07 ශ්‍රේණිය
தரம் 07
Grade 07

නැටුම් (දේශීය) පත්‍රය
நடனம் (சுதேச) வினாத்தாள்
Dancing (Oriental) Paper

පැය 1 1/2
இரண்டு மணித்தியாலங்கள்
1 1/2 Hours

- 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුර සපයන්න.
- අංක 01 සිට 05 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද වරහන් තුළ යොදන්න.

01. තාලය තබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ දවුලයි ( )

02. උඩරට නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ වෙස් ඇඳුම් කට්ටලයයි ( )

03. ' ඇත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ ' මෙය කුළු නැටුමට භාවිතා කරන කවියකි. ( )

04. ආශිර්වාද කවි , ශාන්ති කර්මයන්හි , අන්තර්ගත අනාසාත්මක කවි විශේෂයකි. ( )

05. ' භාවයක් යනු ' මිනිස් පුද්ගලයෙකුගේ සිතෙහි නොවෙනස්ව නැතහොත් ස්ථාවරව පවතින්නා හැඟීම් සමුදායකි. ( )

- ප්‍රශ්න අංක 06 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වනුයේ
   1. ගැටබෙරය , 2. යක්බෙරය
   3. දවුල 4. තම්මැට්ටම

07. ' අගේ වඩන මගේ තාලම් හරඹ බලන්නේ ' මෙය
   1. සවරං කවියකි 2. කුළු කවියකි
   3. තාලම් කවියකි 4. ලී කෙළි කවියකි

08. ඇසළ මාසයේ පවත්වනු ලබන සංස්කෘතික වටිනාකමින් යුත් පෙරහැරකි.
   1. මහනුවර දළදා පෙරහැර 2. මිහිඳු පෙරහැර
   3. සංඝමිත්තා පෙරහැර 4. කඨින පූජා පෙරහැර

09. ශ්‍රී ලංකාවට නිදහස ලැබූ දිනය වනුයේ
   1. 1948 පෙබරවාරි 24 2. 1948 පෙබරවාරි 04
   3. 1948 ජනවාරි 14 4. 1948 අප්‍රේල් 04

10. කළුතර , ගාල්ල , මාතර ආදි මුහුදුබඩ ප්‍රදේශවල ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය වනුයේ
   1. උඩරට 2. පහතරට
   3. සබරගමු 4. භාරත නාට්‍යම්



| 25

11. ප්‍රස්තාරකරණයේ දී යෙදිය යුතු තාල සංඥා දෙක වන්නේ

1. ( + , - )
2. ( - , + )
3. ( / , + )
4. ( / , ^ )

12. දවුල සකස් කර ගැනීමට ගන්නා දැව වර්ගයකි.

1. ඇහැළ
2. ප්‍රුණු මිදෙල්ල
3. කළුවර
4. තේක්ක

13. අවකාශ භාවිතය ප්‍රධාන වශයෙන් කොටස් කීය ද ?

1. 2 කි
2. 3 කි
3. 4 කි
4. 1 කි

14. දේශීය නර්තන සම්ප්‍රදායේ ශිල්පීය ප්‍රාගුණ්‍ය එළිදක්වන අවස්ථාවකි.

1. කලඑළි මංගල්‍යයේ දී
2. පුහුණුවීම් කටයුතුවලදී
3. තරගයකදී
4. පෙරහරෙහි නර්තනය යෙදෙන අවස්ථාවක දී

15. රාමසාන් උත්සවය සමරනු ලබන්නේ කුමන ජන වර්ගයක් විසින් ද ?

1. මුස්ලිම්
2. සිංහල
3. ද්‍රවිඩ
4. බර්ගර්

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.

16. තනි තිත් ප්‍රභේද ...................................... කි.

17. සබරගමු නර්තන සම්ප්‍රදායේ අත් සරඹ හඳුන්වනුයේ ............................... පද නමිනි.

18. ගායනය කිරීමේ දී ගීතයකට අනුව ඇඳෙන අවස්ථා ........................................ යන පාරිභාෂික පදයෙන් හඳුන්වයි.

19. දේශීය නර්තන සම්ප්‍රදායන් ගණන ............................................... කි.

20. සාම්ප්‍රදායික භාණ්ඩ හා ............................................ යොදා ගනිමින් තේමාවක් අනුව පෙරහැරකට සුදුසු සමූහ වාදනයක් නිර්මාණය කළ හැකියි.

11 කොටස

ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.

01.
1. තුරඟා වන්නම හෝ හවාදි තාලය සිංදු වන්නමෙහි තාලරූපය සඳහන් කරන්න. (ලකුණු 02)
2. එම වන්නමෙහි කවියක් ලියන්න. (ලකුණු 04)
3. තුරඟා වන්නමේ / හවාදි තාලය සිංදු වන්නමෙ හි කස්තිරම / ඉරට්ටිය ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

02.
1. දවුල පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 02)
2. දවුල භාවිතා වන අවස්ථා 2 ක් නම් කරන්න. (ලකුණු 02)
3. එහි රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න. (ලකුණු 06)

03. ජන වර්ග හා බැඳි සංස්කෘතික උත්සව අගයමු.

1. රාමසාන් උත්සවය පැවැත්වීමට හේතු 2 ක් ලියන්න. (ලකුණු 02)
2. එම උත්සවයෙහි ඇති ආගමික හා සංස්කෘතික වටිනාකම් 2 ක් ලියන්න. (ලකුණු 04)
3. එම උත්සවය හා බැඳි කලාත්මක අංග මොනවා ද ? (ලකුණු 04)

04.
1. ගැමි නැටුම යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)
2. කුළු නැටුමෙහි හා තාලම් නැටුමෙහි ඇති සුවිශේෂී ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 04)
3. කුලු නැටුමෙහි කවියක් හා තාලම් නැටුමෙහි කවියක් ලියන්න. (ලකුණු 04)